# ලෞකික හා ලෝකෝත්තර වින්දනය

එච්.එම්.එස්.එම්.ජයතිලක

බුදු දහම පාදක කර ගනිමින් බුදු දහමේ පවතින යථා ස්වභාවය ගෙනහැර දක්වන විශිෂ්ඨ නිර්මාණයක් ලෙස රන් කරඬුව නම් කෘතිය හඳුනාගත හැකිය. 2014 වසරේදී රචිත මෙම කෘතිය රචනා කර ඇත්තේ බටුවන්ගල රාහුල හිමියන් විසින්ය. පිටු 160කින් සමන්විත මෙම ග්‍රන්ථය රචනා කර ඇත්තේ දඹදිව සංචාරයක නිරත වන හිමිනමක් පාදක කරගනිමින්ය. 2015 වසරේ ස්වර්ණ පුස්තක සම්මානය ලද විශිෂ්ටතම නවකතාව ලෙසට මෙම ග්‍රන්ථය තේරී පත්ව ඇත. බුදු දහමේ හරය සැබෑ ජීවිතයට සකසා ගන්නේ කෙසේද යන්න මෙහි මැනවින් ගෙනහැර දක්වා ඇත. ආශාවන් පසුපස ගමන් නොකර යථාර්ථවාදීව සමාජයට මුහුණදෙන ආකාරය මෙමගින් විදහා දක්වනු ලබයි. බුදුදහමේ හර විශ්‍රාන්තිය ලබන්නේ කෙසේද යන්න හා ලෞකික ජීවිතය තුළ ලබන විශ්‍රාන්තිය බුදුදහමේ හරයෙන් වෙනස් වන්නේ කෙසේද යන්න රන් කරඬුව නම් කෘතිය ඔස්සේ විමසා බලමු.

පුද්ගලයකු විවිධාකාරයෙන් විශ්‍රාන්තිය ලබනු ලබයි. මෙම කෘතියෙහි එන හිමිනම විශ්‍රාන්තිය ලබන්නේ මේ අයුරිනි. නින්ද අද තම අසලට නොඑන එකක් බව භික්ෂුවට දැනුනේය. ඒ නිසාම භික්ෂුව සයනයේ එරමිණියා ගොතාගෙන ආනාපාන සතිය වඩන්න වෙහෙසුණේය. බෝධි වෘක්ෂය අබියසට ගිය භික්ෂුව බෝධියට මුහුණලා එරමිණියා ගොතාගෙන සලපතල මළුවේ ඉඳගත්තේය. ඔවුන් එතැනින් ඉවත් යද්දී එරමිණියා ගොතාගෙන භාවනායෝගීව සිටින බෝසතාණන් වහන්සේගේ සෘජුකය භික්ෂුවට දක්නට ලැබුණේය. සාමණේරයෝ ලෝකය අමතක කර ගස්කොළන් ඇළ දොළ සතා සිව්පාවා ගැන පමණක් සිතමින් භාවනා වඩන්නට පටන්ගත්තෝය.... ඒ හඬ පංචසිඛගේ හේරුණ්ඩ වීණාවේ තත් පිරිමදින හඬ තරම් මිහිරි යැයි එක්වරම භික්ෂුවට සිතුණේය. භික්ෂුව ඒ හඬට සවන් දී සිටියේයඃව සාමාන්‍යය සමාජයේ සිටින පුද්ගලයන් ලෞකික ජීවිතය තුළ අඹු සැමියන් ලෙස විශ්‍රාන්තිය සොයන ආකාරය පිළිබඳව මෙසේ දක්වා ඇත. එවැන්නෙක් බිරිද ඉල්ලා සිටින්නේ අහවල් කාරියකටදැයි කියලා බෝසතානන් වහන්සේ නොදැන සිටියාදැයි කියන්න පුළුවන්දඃවඒ දන්දීම කළේ ලිංගික කුහකත්වය ඉරිසියාව පහ කරගත්ත හිතකින් කියලයි මම කියන්නේඃවඑම පුරුෂයෝ තුන්දෙනා තවත් නිමේෂයකින් එම අඹුවන් තුන්දෙනාගේ අත් අල්ලාගෙන නර්තනයක යෙදුණෝය ගුප්ත මැටි කුටියේ ආලින්දයට වී මොවුන් දෙස බලා සිටියේය... එහෙනම් උඹ මත්පැන් බොන්න ඇති හොඳට උඹ දොඩනවා වැඩියි මට මේ පොත බලන්න දීලා උඹ කරත්තේ දක්කපං... මග වෙහෙස දුරු කිරීම සඳහා ගුප්ත විටින් විට ගී ගායනා කළේය.

ඒ සමගම මංගල භේරී නාදයෙන් සහ සක් හඬින් හාත්පස ගිගුම් දුන්නේය... සියළු කලා ගුරුකුල නියෝජනය කරමින් තූර්යවාදන හඬද ගුවනට එකතු වූවේය... කස හඬ පරදන බෙර හඬද බෙර හඬ පරදන දවුල් හඬද දවුල් හඬ පරදන සක් හඬද... හේරුණ්ඩ වීණාවේ තත් පිරිමැදෙන හඬ ඒ සමගම පැතිර සතර අතටම විහිදී ගියේය... ඉක්මණට වරෙං මම මේ එළියෙ නිදාගන්නේ උඹත් මා ගාව නිදාගනිං සඳ එළියයි සිසිල් වාතයයි අපට හොඳ නින්දක් ගෙනේවි.

පූජ්‍ය බටුවන්ගල රාහුල හිමි විසින් රචිත මෙම ග්‍රන්ථයේ අන්තර්ගතය බුදු දහමෙහි ඇති අනිත්‍යතාවයි. දහම අවබෝධ කර ගැනීම සඳහා විවිධ අවස්ථාවන්ට මුහුණ දුන් උන්වහන්සේ ධර්මය තුළින් විශ්‍රාන්තිය සොයා ගොස් ඇත. නිවැරදි මාවතක් ඔස්සේ ගමන් කළ උන්වහන්සේ සහ එකළ සමාජය විවිධාකාර විශ්‍රාන්ති ක්‍රම භාවිතයට ගනිමින් ජීවත් වී ඇති බව මෙමගින් මනාව පැහැදිලිවේ.

බටුවන්ගල රාහුල හිමි 2014 රන් කරඬුව, 17 වන මුද්‍රණය, සී ස සදීපා ප්‍රකාශකයෝ, 1060, මරදාන පාර, බොරැල්ල.